# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු රාජ්‍යයක් පාලනය කරනු ලබන මූලික මූලධර්ම සමූහයක එකතුවකි.
- මෙරට තුල වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන අතර එය මේ මොහොත වන විට අවස්ථා කදී සංශෝධනයන්ට ලක්වී ඇත.
- ඊට පෙර මෙරට තුල ක්‍රියාත්මක වූයේ 1972 ජනරජ ව්‍යවස්ථාවයි.
- පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සෑම පනතක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල විය යුතුය.
- තවද, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන්නට යන පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බවට ( එනම්, එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවසස්ථාව උල්ලංගනය වන බවට ) යම් පුරවැසියෙකුගේ මතය වන්නේ නම් ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කල හැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා නොපැමිනි මන්ත්‍රීවරුන්ද ඇතුලුව මුලු පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දය (කැමැත්ත ) තිබිය යුතු අතර එහි තවත් සමහර ඉතා වැදගත් යැයි සැලකෙන වගන්තීන් සංශෝධනය කිරීම සඳහා නොපැමිනි මන්ත්‍රීවරුන්ද ඇතුලුව මුලු පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් එය අනුමත කොට තිබිය යුතු වන්නේයි
- ( ජනතම විචාරණ වලට අදාල - 1, 2, 3, 6, 7, 8, 9, 10, 11 ආදිය )

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීම, උපදේශාත්මක අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම, පනත් කෙටුම්පත් වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලත්වය පරීක්ෂා කිරීම, මූලික අයිතිවාසිකම් නඩු කටයුතු විභාග කිරීම, ජනාධිපතිවරණ සහ ජනමත විචාරණ ඡන්ද පෙත්සම් විභාග කිරීම ආදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කාරණා සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති අධිකරණය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතය

- ජනතාව, රජය සහ පරමාධිපත්‍යය
- බුද්ධාගම
- මූලික අයිතිවාසිකම්
- භාෂාව
- පුරවැසිභාවය
- රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම මූලික යුතුකම්
- විධායකය - ජනරජයේ ජනාධිපතිවරයා, අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය සේවය
- ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව, කාර්ය පටිපාටිය සහ බලතල, ආ.ව්‍ය.සංශෝධනය
- ජනමතවිචාරණ, ඡන්ද බලය, ඡන්ද විමසීම් සහ මැතිවරණ
- අධිකරණ, අධිකරණයේ ස්වාධීනත්වය, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය
- මූල්‍ය, මහජන ආරක්ෂාව
- පරිපාලන කටයුතු පිලිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වරයා

ආදී මාතෘකා රැසක් එහි අන්තරගත වේ.

( පරිච්ඡේද 24 කි )

# මූලික අයිතිවාසිකම්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය තුල 10 වන ව්‍යවස්ථාවේ සිට 14 වන ව්‍යවස්ථාව දක්වා මූලික අයිතිවාසිකම් පිලිබඳව සඳහන් වන අතර 15 සහ 126 වන ව්‍යවස්ථාවල සඳහන් සීමා කිරීම් වලට යටත්ව එම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක.

- තවද යම් මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතුවෙන් කඩවී ඇත්නම් හෝ කඩවීමට අත්‍යාසන්න නම් ඒ පිලිබඳව මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරිය හැකිය.
- මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරිය හැකි කාලසීමාව -

- මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරිය හැක්කේ කාටද ?

- 10 වන ව්‍යවස්ථාව - සිතීමේ හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහස
- 11 වන ව්‍යවස්ථාව - වධහිංසා වලින් නිදහස
- 12 වන ව්‍යවස්ථාව - සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම
- 13 වන ව්‍යවස්ථාව - අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම
- 14 වන ව්‍යවස්ථාව - භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යාම් ඊම් යනාදියේ නිදහස

# රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේදී රජය සතු වගකීම් / යුතුකම් කිහිපයක්

- සියලුම තැනැත්තන්ගේ මූලික අයිතිවාසිකම් සහ නන් වැදැරුම් නිදහස සපුරාලීම
- පොදුජන යහපතට ඉවහල් වන පරිදි ප්‍රජාවගේ භෞතික සම්පත් සියලු පුරවැසියන් අතර සමාන ලෙස බෙදා හැරීම
- ජනතාවගේ සදාචාරයෙහිත් සංස්කෘතියෙහිත් තත්වය වැඩිදියුණු කිරීම සහ පෞරුෂත්වයෙහි පූර්ණ වර්ධනය තහවුරු කිරීම
- නූගත්කම සහමුලින්ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදීම සර්ව සාධාරණ සහ සමාන ඉඩ ප්‍රස්ථා ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම
- සමාජ සුරක්ෂිතභාවය සහ සුභසාධනය ඇති කිරීම
- පවුල, සමාජයේ මූලික ඒකකය වශයෙන් රජය විසින් පිළිගෙන ආරක්ෂා කිරීම

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම
- ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම
- තමන් විසින් තෝරා ගනු ලැබූ රැකියාවෙහි හෘදය සාක්ෂියට එකඟව නොපිරිහෙලා වැඩ කිරීම
- පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමද පොදු දේපල අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීමද
- සෙසු අයගේ අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස ගරු කිරීමද
- ස්වභාව ධර්මය සහ ස්වභාවික සම්පත් රැකගැනීමද

ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම වන්නේය. ( 28 ව්‍යවස්ථාව )